# ශ්‍රී ලංකාවේ 1818 නිදහස සටනට සෘජුව සහ අනියමින් සම්බන්ධවූ විහාරස්ථාන සහ දේවාල

The temples and shrines, directly and indirectly, involved in the 1818 War of Independence in Sri Lanka

**චන්දන රෝහණ විතානාච්චි**


## Abstract

Uva and its environs are home to a large number of temples that assisted local rebel leaders as well as warriors in various ways during the 1818 War, also known as the Uva War of Independence and the Kandyan Rebellion. Some of the places that were variously involved in the freedom struggle later became temples. A large number of documents that can study the English side engaged in the war are safe in Sri Lanka and Britain, but there are legends about the Indigenous movement. This presentation summarizes the historical information about several temples and two devalayas, directly and indirectly, involved in the Uva freedom struggle. Also, many other places in the region contributed to the fighting. This book is a very concise compilation of information contained in folklore and legends, as well as information from studies conducted by this author and reported by various researchers and the Department of Archeology.


## හැඳින්වීම

ඌව නිදහස සටන ලෙසින් ද උඩරට කැරැල්ල යනුවෙන් ද හඳුන්වනු ලැබූ 1818 සටනේ දී ස්වදේශික කැරළි නායකයින්ට මෙන්ම සටන්කරුවන් සඳහා විවිධාකාරයෙන් සඳහා උපකාර කළ විහාරස්ථාන විශාල ප්‍රමාණයක් ඌව සහ තදාශ්‍රිත ව පවතී. නිදහස් සටනට විවිධ ලෙසින් සම්බන්ධ වූ ඇතැම් ස්ථාන පසුකාලීනව විහාරස්ථාන බවට පතවී ඇත. සටනට සම්බන්ධවූ ඉංග්‍රීසි පාර්ශ්වය සමබන්ධයෙන් කරුණු අධ්‍යයනය කළ හැකි ලේඛන අති විශාල ප්‍රමාණයක් මෙරට සහ බ්‍රිතාන්‍යයේ සුරක්ෂිත ව තිබෙන මුත් ස්වදෙශිකයින්ගේ සටන් ව්‍යාපාරය පිළිබඳ ව ඇත්තේ ජනප්‍රවාද පමණි. මෙම ඉදිරිපත් කිරීම මගින් ඌව නිදහස සටනට සෘජුව සහ අනියමින් සම්බන්ධවූ විහාරස්ථාන කිහිපයක් සහ දේවාල දෙකක් පිළිබඳ ව ඓතිහාසික තොරතුරු සංලක්ෂ්‍ය කර ඇත. මීට අමතර ව සටනට දායක වූ තවත් බොහෝ ස්ථාන මෙම කලාපයේ දක්නට ලැබේ. ජනප්‍රවාද සහ පුරාවෘත්තවල ඇතුළත් වන තොරතුරු සමඟ මෙම ලේඛකයා කළ අධ්‍යයනවල තොරතුරු ද විවිධ පර්යේෂකයන් හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරනු ලැබූ තොරතුරු ද ඇතුළත් කර ඉතාමත් සංක්ෂිප්ත කර සැකසූ තොරතුරු මෙම ලේඛනයෙන් ඉදිරිපත් කර තිබේ.

## විමර්ශනය

### හමනව ශ්‍රී පූර්වාරාම රජමහා විහාරය

මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බුළුපිටිය ග්‍රාමයේ පිහිටා තිබෙන මෙම රජමහා විහාරස්ථානය 1818 නිදහස් සටනේ දී ඉංග්‍රීසින් විසින් ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ

සිදුකරන ලද විනාශකාරී ක්‍රියාවන් තුළ හානියට පත්වූවකි. නිදහස් සටනට සම්බන්ධ වී කටයුතු කළ බුළුපිටියේ රාළ මෙම ප්‍රදේශය ආශ්‍රිත ව සැඟවෙමින් ඉංග්‍රීසින්ට විරුද්ධව සටන්කර තිබෙන අතර ඔහුව අල්ලාගැනීමට පැමිණි ගමනේ දී ඔවුනට රක්‍ෂාවරණ සැපයූ බවට සළකා මෙම විහාරස්ථානය විනාශකර තිබේ. මෙම විහාරස්ථානය ආසන්නයේ ම පිහිටි වැව ද ඉංග්‍රීසින් විසින් විනාශකර දමා තිබෙන අතර මේ වනවිට එහි දක්නට ඇත්තේ වැව් බැම්මේ කොටසක් පමණි.

නිල්ගල රක්‍ෂිතය ආසන්නයේ පිහිටා තිබෙන මෙම විහාරස්ථානය තැනිතලා භූමියක වියළි පරිසරයක ගොඩනගා ඇත. මෙම විහාරස්ථානය සම්බන්ධයෙන් විමසීමේ දී පැහැදිළි වන්නේ අනුරාධපුර යුගයේ මෙහි ආරම්භය සිදුවී තිබෙන බවකි. කෙසේ වෙතත් එම නිර්මාණ මේ වන විට බෙහෙවින් හායනයට ලක්වී ඇත. පුරාණත්වය පෙන්නුම් කරන සාක්‍ෂි අතරට කැටයමින් සරළ වූ කොරවක්ගල් හයක් දක්නට ලැබෙන අතර ඒවා ප්‍රමාණයෙන් එක හා සමාන ය. මීට අමතර ව ගල්කණු සහිත ස්ථානයේ දක්නට ලැබෙන අතර එය ගොඩනැගිල්ලක අවශේෂ බව පැහැදිළි ය. මීට අමතර ව ගරාවැටී ගිය ස්තූපයක අවශේෂ ද දක්නට ලැබේ. ශෛලමය මලසුනක් ද මෙම විහාරස්ථානයේ තිබේ. භූමිය පුරා විසිරී තිබෙන පැරණි ගඩොළුවලින් තහවුරු වන්නේ පුරාණයේ දී ඉදිකිරීම් ගණනාවක් ම මෙම පරිශ්‍රයේ පවතින්නට ඇති බව ය. පැරණි සංඝාවාසයක් පිළිබඳ ව ද නටබුන් දක්නට ලැබේ. කෙටි ගල් කණු සහිත ස්ථානයක් මෙම භූමියේ දක්නට ලැබෙන අතර ඇතැම් විට එය පුරාණ ආසනඝරයක අවශේෂ විය හැකි ය. ශෛලමය නිර්මාණ බොහෝමයක් මුල් ස්ථානයෙන් විතැන්වී තිබෙන ආකාරය දක්නට ඇත. මේ වනවිට පුරාවිද්‍යා රක්‍ෂිතයක් බවට පත්කර ඇත.

**උණගොල්ල රජමහා විහාරය**

මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙවෙල්වෙල ග්‍රාමයේ මෙම විහාරස්ථානය පිහිටා ඇත. 1818 නිදහස් සමයේ ආරම්භක ස්ථානයක් ලෙස මෙම විහාරස්ථානයට වැදගත්කමක් හිමිවේ. 1817 සැප්තැම්බර් 16 දින ඌව දිසාව භාර උප ඒජන්ත වූ සිල්වෙස්ටර් ඩග්ලස් විල්සන් ව 'මීගහපිටිය වලව්වේ හිටිහාමි මුදියන්සේලාගේ රටේරාළ' විසින් ඝාතනය කරන ලද්දේ මෙම පරිශ්‍රයේ දී බව විශ්වාස කරනු ලැබේ. එම ප්‍රදේශයේ සැඟව සිටි ස්වදේශිකයින් විසින් දිය උල්පතකට දිය බීමට පැමිණි විල්සන් හට හී පාර විද ඝාතනය කොට සිරුර පැහැරගෙන ගොස් තිබූ බව හෙන්රි මාෂල් දක්වා තිබේ.[1]

මෙම විහාරස්ථාන පරිශ්‍රය ආශ්‍රිත ව උප ඒජන්ත විල්සන්ගේ මළසිරුර ගෙනවිත් තිබූ ස්ථානය සහ රටේ රාළ විසින් හීයෙන් විදින ලද ස්ථානයන් හි ස්මාරක දෙකක් පිහිටුවා ඇත.

**ඌව පරණගම සපුගොල්ල තපෝවනාරාම මූල මහා විහාරය**

බදුල්ල දිස්ත්‍රික්කයේ ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සපුගොල්ල ග්‍රාමයේ මෙම විහාරස්ථානය පිහිටා ඇත. අමරපුර සාම ශ්‍රී සංඝ සභාවට අයත් මෙම විහාරස්ථානයෙන් පසුකාලීන ව විහාරස්ථාන රාශියක් දිවයින පුරා ඇති වී හේතු කොටගෙන මූල මහා විහාරය නමින් ව්‍යවහාර වේ.

ඌව පරණගම මැක්ඩොවල් බලකොටුව සමීපයේ පිහිටි මෙම විහාරස්ථානය අදින් වසර 350 කට පමණ පෙර මහනුවර යුගයේ ආරම්භ වූවකි. 1818 නිදහස් සමයේ ආරම්භක අවස්ථාවේ දී ස්වදේශික සටන්කරුවන්ට ආරක්‍ෂාව ලබාදුන් ස්ථානයක් ලෙස ප්‍රසිද්ධියට පත්ව තිබේ.[2] මේ

[1] මාෂල් හෙන්රි සිංහලේ පරි. එච්.ඇම්. සෝමරත්න විහිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව. පිටු. 155
[2] පූජ්‍ය වේල්ලේවෙල උපනන්ද හිමි විහාරාධිපති ඌව පරණගම සපුගොල්ල මූල මහ විහාරය

හේතුව නිසා මෙම විහාරස්ථානය ඇතුළු අවට විහාරස්ථාන කිහිපයක් ම ඉංග්‍රීසින් විසින් විනාශකර දමා ඇත.

මෙම විහාරස්ථානය ආශ්‍රිත ව මහනුවර යුගයේ නිර්මිත යම් ප්‍රමාණයකින් ශේෂව පවතී. ඒ අතර පිළිමගෙයට ප්‍රධාන ස්ථානයක් හිමිවේ. මහනුවර යුගයේ ලක්ෂණ සහිත හිඳි සහ හිටි පිළිම වහන්සේලා ද, එම යුගයට අයත් බිතු සිතුවම් ද මෙම පිළිමගෙය ආශ්‍රිත ව දක්නට ලැබේ.

කැප්පෙටිපොල නිලමේ වෙල්ලස්ස බලා යාමේ දී මෙම විහාරස්ථානය ඔස්සේ ගමන් කර තිබෙන බව ජනප්‍රවාදයේ දැක්වේ. මෙම විහාරස්ථානයට සමීපයේ පිහිටා තිබෙන ස්ත්‍රීපුර කන්ද ආශ්‍රිත ව ස්වභාවික ගුහා රාශියක් දක්නට ලැබෙන අතර නිදහස් සටනට සම්බන්ධ වූවන් එම ස්ථානවල සැඟවී සිට සතුරන්ට පහරදුන් බවට ද ජනප්‍රවාදයේ තොරතුරු පවතී. බදුල්ල සිට මහනුවර දක්වා ගිය රාජකීය ගමන් මාර්ගය මෙම සපුගොල්ල හරහා යෙදී තිබී ඇත.

### ඌව පරණගම ගලතිහ ශ්‍රී ජයසුමනාරාමය

බදුල්ල සිට මහනුවරට යන රාජකීය මාර්ගයේ පිහිටා තිබෙන විහාරස්ථානයකි. 1818 නිදහස් සටනේ දී ස්වදේශිකයින්ට රක්ෂාවරණය දුන් ස්ථානයක් ලෙස ජනප්‍රවාදයේ සඳහන් වේ.

මෙම ස්ථානය ආශ්‍රිත ව පුරාණ දේවාලයක් දක්නට ලැබෙන අතර වර්තමානයේ ද මෙම දේවාලය ප්‍රසිද්ධ ව පවතින්නකි. මෙම දේවාලය ක්‍රි.ව. 1525 ඉදිකර තිබෙන අතර පත්තිනි සහ මැණික් බණ්ඩාර දෙවියන් උදෙසා කැපකරන ලද්දකි. මෙම ස්ථානයේ ම පුරාණ බෝධීන් වහන්සේ නමක් තිබූ බව විහාරාධිපති ස්වාමීන් වහන්සේ පවසන ලදි.[3]

බදුල්ල දිස්ත්‍රික්කයේ ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැකලා වසමේ මස්පන්න ගලතිහ තැනිතලා භූමියක පිහිටා තිබෙන විහාරස්ථානයකි. පුරාණයේ දී මහියංගන විහාරය වන්දනාමාන කිරීම සඳහා මෙම ගලතිහ විහාරය පිහිටිගම ඔස්සේ ගමන්කර තිබෙන අතර පැරණි අම්බලමක් ද තිබූ බව පැවසේ. ශෛලමය පැන් කොතලයක් ද එම අම්බලම ආශ්‍රිත ව තිබී ඇත. ඉපැරණි සොහොනක් මෙම විහාරස්ථානය ආසන්නයේ තිබෙන බව ද වාර්තා වේ.

### නාගල රජමහා විහාරය

මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාගල ග්‍රාමයේ පිහිටා තිබෙන මෙම විහාරස්ථානය 1818 නිදහස් සටනේ දී ස්වදේශික සටන්කරුවන් උදෙසා රක්ෂාවරණය ලබාදුන් ස්ථානයක් බව ජනප්‍රවාදයේ දැක්වේ. මෙම විහාරස්ථානයේ සිටි භික්ෂූන් වහන්සේලා ද මේ හේතුවෙන් ඉංග්‍රීසින්ගේ අත්අඩංගුවට පත්වූ බවක් ද වාර්තා වේ.[4]

නාගල රජමහා විහාරස්ථානයේ ඉතිහාසය අනුරාධපුර යුගය දක්වා දිව යන්නකි. එහි තිබෙන ක්‍රිස්තු වර්ෂ හත්වන සියවසට අයත් ගිරි ලිපියක එම ස්ථානය සමීපයේ ම තිබෙන වැවේ ජල පරිබෝජනය කොට වගාකළ කුඹුරුවල ආදායමින් කොටසක් බදු ලෙස විහාරස්ථානය වෙත පූජා කළ බව සඳහන් ව තිබේ. පුරාණ වැව, විහාරස්ථානය සහ ගම මැනවින් එකට සම්බන්ධ වූ ස්ථානයක් ලෙසින් මෙහි පිහිටීම පරීක්ෂා කිරීමේ දී තහවුරු වේ.

[3] නාගදීපයේ පඤ්ඤාසාර හිමි, විහාරාධිපති - ගලතිහ ශ්‍රී ජයසුමනාරාමය.

[4] බදුල්ලගම්මන සුමනසාර හිමි, ඌව වෙල්ලස්ස පහළ බින්තැන්න නැගෙනහිර ප්‍රධාන සංඝනායක හිමි, නාගල රජමහා විහාරය

මෙරට මූල ඓතිහාසික අවධියේ වාසය කළ ස්වදේශික ජන කණ්ඩායමක් වූ නාග ගෝත්‍රිකයින් මෙම ප්‍රදේශය ආශ්‍රිත ව වාසය කළ බවට ද ජනප්‍රවාදයේ පවතින තොරතුරකි. දුටුගැමුණු රජු රුවන්වැලි සෑය ඉදිකිරීමේ දී එහි තැම්පත් කරලීම පිණිස ධාතූන් වහන්සේලා මෙම විහාරස්ථානයට වැඩම කළ බවට ද තවත් ජනප්‍රවාදයක තොරතුරක දැක්වේ.

මෙම විහාරස්ථානය ආශ්‍රිත ව අනුරාධපුර යුගයට අයත් ලෙස හඳුනාගත හැකි පැරණි පියගැටපෙළ අවශේෂ වන කොරවක්ගල්, කැටයම් රහිත සඳකඩ පහන්, ගල්ටැම් ආදිය දක්නට ඇත. නටබුන් වී ගිය ස්තූපයක අවශේෂ ද මෙම ස්ථානයේ පවතී. විශාල ශෛලමය ආසන දෙකක් මෙම විහාරස්ථානයේ දක්නට තිබෙන අතර ඒවා මෙම ස්ථානයේ පුරාණයේ පැවති ආසනඝරයක නටබුන් විය හැකි බව විහාරාධිපති ස්වාමීන් වහන්සේ ප්‍රකාශකර සිටින ලදි.

මෙම විහාරස්ථානය ආශ්‍රිත ව ගොඩනැගිල්ලක් තැනීමට අත්තිවාරම් කැපීමේ දී පුරාණයේ ජලය පරිවාහනය කළ මැටි නල පද්ධතියක අවශේෂ හමුවී ඇත. අගල් 10 දිග මැටි නල 11 හමුවූ බව විහාරාධිපති හිමියන් පැවසීය. ඒ අනුව මෙම විහාර පරිශ්‍රය ආශ්‍රිත ව පුරාණයේ දී භූගත ජල මාර්ගයක් පැවති බව තහවුරු වේ. ඇතැම් විට ඒ අසල පිහිටි වැවේ සිට ජලය ගෙනයාම පිණිස මෙම නල මාර්ගය ඉදිකරන්නට ඇත.

ඉංග්‍රීසින් විසින් මෙම විහාරස්ථානය ගිනි තබා විනාශ කරන ලද අතර ඒ අසල තිබුණු වැව ද කඩා බිඳ දමා ඇති බව විහාරාධිපති හිමියන් ප්‍රකාශ කරන ලදි.

**වෙහෙරගොඩ රජමහා විහාරය**

මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිල්ගල වසමේ හමාපොල ග්‍රාමයේ ඌයන්කුඹුර වැව ඉස්මත්තේ මෙම විහාරස්ථානය පිහිටා ඇත. හමාපොල දූරයා හා හමාපොල රංකිරි නමින් හැඳින් වූ සටන් නායකයෙකු හා නායිකාවක මෙම විහාරස්ථානය ආශ්‍රිත ග්‍රාමයේ සිටි අතර ඔවුන් බොහෝවිට මෙම විහාරය කේන්ද්‍ර කොටගනිමින් සටන් සංවිධානය කරන්නට ඇති බව සිතිය හැකි ය.[5]

මෙම විහාරස්ථානය ආශ්‍රිත ව ටැම් ලිපියක් තිබෙන අතර එහි දැක්වෙන්නේ වැව් ජලයෙන් වගා කරන කුඹුරුවල ආදායමින් හතරෙන් එකක් විහාරස්ථානය වෙත ලබාදිය යුතු බවත් එය උල්ලංගනය කළහොත් බලු කපුටන් ලෙස උපදින බවත් ය. ඒ අනුව මෙම ටැම් ලිපිය අත්තාහි කණුවක් බව තහවුරු වේ.

මෙම විහාරස්ථානය ආශ්‍රිත නටබුන් වී ගිය ස්තූපයක අවශේෂ දක්නට ලැබේ. මීට අමතර ව ගල් කණු සහිත ස්ථාන ද දක්නට ලැබේ.

**විදුරුපොල ශ්‍රී පියතිස්ස පිරිවෙන් විද්‍යායතනය**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගවරගම්මන ග්‍රාමයේ පිහිටා තිබෙන විදුරුපොල ශ්‍රී පියතිස්ස පිරිවෙන් විද්‍යායතනය යනු ඌවේ උප ඒජන්තවරයා වූ සිල්වෙස්ටර් ඩග්ලස් විල්සන් මහතාගේ නිවස්නය වේ. මෙම ස්ථානයේ ඉතිහාසය 1815 සිටම පෙළ ගැස්වීමේ හැකියාව පවතී.[6] ඒ අනුව විවිධ පිරිස් අතරට ගිය මෙම බංගලාව විහාරස්ථානය සඳහා හිමිවී ඇත්තේ 1968 වර්ෂයේ දී ය.

---

[5] කොකුන්නෑව සාරානන්ද හිමි, විහාරාධිපති, වෙහෙරගොඩ රජමහා විහාරය, නිල්ගල, බිබිල.

[6] කාශ්‍යප හිමි, කොටවෙහෙර, 2018 උඩරට වන සටන හා ඉහළ ඌවේ පුරාවිද්‍යා උරුමය, 1818 ඌව වෙල්ලස්ස මහා සටන, ඌව පළාත් සභාව, 145-6

ඉතාමත් අලංකාර හූ දර්ශනයක් තුල පිහිටි විල්සන් බංගලාව, විල්සන් තැන්න නමින් හැඳින්වෙන තැනිතලා භූමියට මුහුණලා පිහිටා ඇත. මෙම ස්ථානය ඉංග්‍රීසි හමුදාව තම යුද්ධ සැළසුම් සකස් කිරීම පිණිස යොදාගන්නට ඇති බවට ද විශ්වාස කරනු ලැබේ.[7] මෙම නිවස වටා පිහිටි වෙලන්හින්න, හීම්බෙලි අත්තේවෙල හා මැක්ඩොවල් යන බලකොටු සඳහා මෙම ස්ථානයේ දී ගනු ලැබූ තීරණ පහසුවෙන් දැනුම්දීමට හැකිවීම යන කාරණය ද භූමිය තෝරා ගැනීම කෙරෙහි හේතුවන්නට ඇත.

මේ වන විට විල්සන්ගේ නිල නිවාසය විහාරස්ථානයේ සංඝාවාස බවට පත්ව තිබේ. එහි තිබෙන ශ්‍රී පියතිස්ස ශාලාව යනු පුරාණ විල්සන් උප තැපැල්හල වේ. පුරාණ අශ්ව ඉස්තාලය එම ශාලාවට පසෙකින් දක්නට ඇත. මේ වන විට මෙම නිවස්නයේ බාහිර වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ පූර්ණ වශයෙන් ම වෙනස් කොට තිබේ. අභ්‍යන්තරිකව පමණක් ඉංග්‍රීසි සමයට අයත් සාක්‍ෂි ස්වල්ප වශයෙන් ශේෂව පවතී.

**ඊතණවත්ත පත්තිනි දේවාලය**

මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙවෙල්වල ග්‍රාමයේ උණගොල්ල විහාරය සමීපයේ පිහිටා තිබූ මෙම දේවාලය මේ වනවිට නටබුන් බවට පත්වී තිබේ. නිදහස් සටනේ ආරම්භක අවස්ථාවේ දී ඌව උප ඒජන්තවරයා වූ විල්සන් මහතා හී සැරෙන් විද මරාදමන ලද්දේ මෙම ස්ථානයේ දී බව ජනප්‍රවාදයේ මෙන් ම ඇතැම් මූලාශ්‍රයන්ගේ ද තොරතුරු සඳහන් වේ. පුරාණ දේවාලයේ තිබුණ දේවාභරණ මේ වනවිට උණගොල්ල රජමහා විහාරස්ථානයේ විහාරාධිපති හිමියන් භාරයේ පවතී. ජනප්‍රවාදයට අනුව මෙම දේවාලයේ ඉතිහාසය දීර්ඝකාලයක් අතීතයට යන්නකි.

මෙම ස්ථානයේ මේ වන විට ගරා වැටී තිබෙන පත්තිනි දේවාලයේ අවශේෂ දක්නට ලැබේ. එහි ඉදිරිපස දොරටුව යැයි අනුමාන කළ හැකි ස්ථානයේ ගල් කණුවක් දක්නට ඇත. ඒ අසලම තවත් ගොඩැල්ලක් තිබෙන අතර එය පැරණි සූනියම් දේවාලයක් බව විශ්වාස කරනු ලැබේ.

මෙම දේවාලය ආසන්නයේ ස්වභාවික ජල උල්පතක් තිබෙන අතර එය දේවාල කුඹුරේ උල්පත ලෙස ව්‍යවහාර කරනු ලැබේ. උප ඒජන්ත විල්සන් උල්පතෙන් ජල පහසුවට ගිය අවස්ථාවේ දී මීගහපිටිය රටේ රාළ විසින් විද මරන ලද බව විශ්වාස කෙරේ. මෙම අවස්ථාවේ දී ඒ සමග ඉකිරිම්පෙළ මිටි ගම්මහේ, දොඩම්ගොල්ලේ හෙට්ටිපොලයා, බකිනිගහවෙල උපාසක අප්පු සහ ඊතණගොඩ බඩපිස්සා නමින් වූ තවත් සිව් දෙනෙකු ද, මීගහපිටිය රටේ රාළගේ සොහොයුරෙකු වූ ගං ඇති රාළ නැමැත්තෙකු ද සිටි බව ජනප්‍රවාදයේ දැක්වේ.

**හීල්ඔය පුරාණ විහාරස්ථානය**

හීල්ඔය පුරාණ විහාරය නොහොත් හීල්ඔය ශ්‍රී සුමංගල පුරාණ විහාරස්ථානය පිහිටා ඇත්තේ ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රීක්කයේ, ඇල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ, හීල්ඔය ග්‍රාම නිළධාරි වසමේ ය. බණ්ඩාරවෙල නගරයේ සිට හීල්ඔය මාර්ගයේ, හීල්ඔය කඩ මණ්ඩිය අසලට පැමිණීමට පෙර ඇති සතරමං හන්දියෙන් දකුණු අත පැත්තට ඇති මාර්ගයේ මඳ දුරක් යා යුතුවේ.

හීල්ඔය විහාරස්ථානයේ ඉතිහාසය, බ්‍රිතාන්‍ය පාලන යුගයේ මුල් අවධිය දක්වාම පැරණිය. එකළ මෙම ප්‍රදේශයේ ප්‍රාදේශිය නායකයකු වශයෙන් කටයුතු කල මුහන්දිරම් නිළමේ තමාගේ ඉඩමක බෝධීන් වහන්සේ නමක් රෝපණය කර උඩරට කැරැල්ලෙන් පසු ඇතිවූ තුන් බිය සමනය කර

[7] එම

දෙන ලෙසට අධිෂ්ඨාන කරනු ලැබූ බව ජනප්‍රවාදයේ දැක්වේ. මෙය 1818 පසු කාලයේදී සිදුවූවක් විය.

කන්ද උඩරට සිංහල රාජධානිය ඉංග්‍රීසීන්ට යටත් වීමට අවුරුදු පනහකට පමණ පෙර භික්ෂූන් වහන්සේලාගේ හිඟය පිළිබඳ ව විහාරස්ථානයට යාබද ඉඩමේ වාසය කළ තැන්නේකුඹුර වලව්වේ විසූ විජේසුන්දර රටේ රාළ හා හීල්ඹය පල්ලපේරුවේ ඉඩමේගෙදර විසූ දිසානායක අප්පුහාමි යන අය කතිකා කරගත් පරිදි මෙම විහාරස්ථානය සාදවා සඟසතු කර ඇති බව සඳහන් වේ.[8]

ඌවේ තිබෙන මල්වතු මහා විහාර පාර්ශවයට අයත් පැරණිම විහාරස්ථානය වන්නේ හීල්ඹය පුරාණ විහාරස්ථානයයි. එයට හේතුව වන්නේ ඌවේ ඇති මල්වතු මහා විහාර පාර්ශවයට අයත් පැරණිතම පොහෝය ගෙය පිහිටා ඇත්තේ මෙම විහාරස්ථානයේ වීමය. පැරණිතම පොහෝ ගෙය දිරාපත් වු බැවින් අළුතින් පොහොය ගෙයක් ඒ මත ඉදි කර ඇත. එහෙත් පැරණි සීමාව ලකුණු කරන ලද පැරණි ගල් කණු එලෙසම අද දක්වාත් තිබේ.

විහාරස්ථානයේ චෛත්‍ය. බෝධිය, පිළිම ගෙය යන ඒවා සතරැස් පවුරකින් වටකොට සාදා තිබේ. පවුරේ පහන් තැබීමට හැකි ආකාරයට ත්‍රිකෝණාකාර කවුළු නිර්මාණය කර ඇත. පුරාණ බෝධිය, බෝධි ප්‍රාකාරයකින් වට කර ඇත. පිළිමගෙය දෙපස දේවාල දෙකකි. පිළිමගේ හිඳි පිළිමය හැර ඉතිරි සියළුම රූප මූර්තියෙන් කැටයම් කර ඇත. එසේම බිතු සිතුවම් ද ඇඳ තිබෙන ආකාරය හඳුනාගත හැකි ය. විහාර ගෙයට ඇතුළු වන ද්වාරයට උඩින් මකර තොරණ නිර්මාණය කර ඇත. මූර්තියෙන් සහ චිත්‍රයෙන් මෙම විහාරස්ථානයේ වැඩසිටි ස්වාමීන් වහන්සේලාගේ රූප දක්වා ඇත.

**දෝව රජ මහා විහාරය**

පළාතේ බදුල්ල දිස්ත්‍රීක්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ දෝව ග්‍රාමයේ පිහිටා තිබෙන මෙම විහාරය ඉතිහාස පොත් පත් හී සඳහන් වනනේ *කුඹල්තිස්ස ආරියකර* විහාරය ලෙසිනි. පසු කලෙක මෙම විහාරය දෝව රජ මහා විහාරය ලෙසට පත් වී ඇත. මෙම විහාරස්ථානය 1818 නිදහස් සටනේ දී ස්වදේශික සටන්කරුවන් උදෙසා රක්‍ෂාවරණය ලබාදුන් ස්ථානයක් බව ජනප්‍රවාදයේ දැක්වේ.

පඩිපෙල පහල දකුණු අත පැත්තේ ඇත්තේ විශාල බෝධියකි. මෙම විශාල බෝධියට ඉදිරියෙන් එක් පැත්තකට වන්නට කුඩා ප්‍රමාණයේ පොකුණක් දක්නට ලැබෙන අතර, පොකුණෙහි මැද ඇති කුඩා හුණු ගල් තලාවේ ඇති එක් කවුලුවකින්, නොකඩවාම ජලය පොකුණට ගලා ගෙන එයි. මෙම පොකුණ කොපමණ ඉඩොරයක් පැමිණියත් නොසිඳෙන බව ප්‍රදේශවාසීන් පවසති.

මෙහි ලෙන් විහාර ගෘහය ද නෙත් පිනවන සුළුය. බෝධියට ඉදිරියෙන් ඇත්තේ ලෙන් විහාරයයි. ලෙන් විහාරය නාර්මාණය කර ඇත්තේ කුටි තුනක් වන ආකාරයටය. ප්‍රථමයෙන්ම ඇති ගල් ලෙනට ඇතුළු වන ද්වාරය දෙපස වටුක රාක්ෂයාගේ සහ කුවේර රාක්ෂයාගේ සිතුවම් ඇද ඇත. ප්‍රධාන ද්වාරයේ උළුවස්ස ගලින් නිර්මාණය කර ඇති අතර එහි 1880 වර්ෂය සඳහන් කර ඇත. ඉන් අනතුරුව දක්නට ලැබෙන ප්‍රථම ගල් ගුහා කුටීරයේ මහනුවර සම්ප්‍රදායට අයත් චිත්‍ර ඇති අතර අනෙක් කුටීර දෙකෙහි ඊට බෝහෝ කාලයකට ප්‍රථමයෙන් අදින ලද චිත්‍ර දක්නට ලැබේ. පළමු ගල් ගුහා කුටීරය පසු කර දෙවැන්නට එළඹීමට ප්‍රථමයෙන් උළුවස්සට උඩ මකර තොරණ නිර්මාණය කර ඇත.

[8] බණ්ඩාර, තිලකසිරි., 1997, ඌව විහාර වංශය, ඌව පළාත් සංස්කෘතික කටයුතු අමාත්‍යංශය, ඌව පළාත් සභාව.

තුන් වන ගුහා කුටීරයේ ඉතා පුරාණ චිත්‍ර මූර්ති සහ කැටයමින් සමන්විතය. දෝව රජ මහා විහාරස්ථානය තුළ යුග කිහිපයකට අයත් චිත්‍ර, සිතුවම් සහ පිළිම දක්නට ලැබේ. මහනුවර යුගයට අයත් චිත්‍ර ඒ අතර ප්‍රධාන ලෙස දැකිය හැකිවේ.

විහාර භූමියේ පිහිටි විශාල ගල් පර්වතය මත අඩි 36 ක් පමණ උසින් යුතුව නෙළා ඇති බුද්ධ ප්‍රතිමාවක් ද දක්නට ඇත. එහි නිර්මානාත්මක ලක්ෂණ අනුව පැහැදිළි වන්නේ අනුරාධපුර මධ්‍ය කාලයට එම අර්ධ උන්නත ශෛලමය හිටි පිළිමය අයත් වන බවකි. කටාරම් කෙටූ ගල්ලෙන තුළ පවතින බොහෝ නිර්මාණ වසර 400 කට පමණ ඉහතදී නිර්මාණය කරන ලද ඒවාය. එහි ඇති අනර්ඝ මකර තොරණ හා ගල් උළුවහු වර්ෂ 1800 දී පමණ නිර්මාණය කරන ලද ඒවාය. ලංකාවේ ස්ථාන තුනකදී පමණක් දැකිය හැකි යක්ෂ රූප දෙකක් මෙහි දක්නට ඇත. සියවටුක හා අඝෝර නම් වූ මෙම යක්ෂ සේනාධිපතියන් පන්සල හා කෝවිල් ආරක්ෂා කරන බැවින් ඒ සඳහා නිමවා ඇති බවක්ද ප්‍රකාශ වෙයි. මෙහි ඇති උමං මාර්ගයෙන් එකළ රාවණා ඇල්ල දක්වා ගමන් කොට ඇති බවද පොත පතෙහි සඳහන් වේ. මෙහි නිමවා ඇති දාගැබ ද වෙනත් විහාර හා සසඳා බැලීමේදී සුවිශේෂී බවක් පෙන්නුම් කෙරේ.

## ඓතිහාසික කොටසර රජමහා විහාරය

පහළ ඌවේ පුරා විද්‍යාත්මක වටිනාකමක් ඇති ඓතිහාසික පූජනීය ස්ථානයක් ලෙස කොටසර පියංගල රජමහා විහාරය හැඳින්විය හැක. කොටසර පියංගල රාජ මහා විහාරය ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මල්ලැහැව ග්‍රාම සේවා නිලධාරි වසමේ පිහිටා ඇත.

කොටසර පියංගල වෙහෙර, දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ පටන් කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය දක්වා දිවෙන කාල පරාසයකට හිමිකම් කියන නටබුන් හා ආරාම සංකීර්ණයකින් සමන්විත ස්ථානයකි. දැනට සොයාගත් නටබුන් අතර අභිලේඛන ගත තොරතුරක් දක්නට නැතත් මහාවංශය, ථූපවංශය, කුඩපත් වැනි ඓතිහාසික මූලාශ්‍රවල මෙම පුද බිම පිළිබඳ ලේඛන ගත සාක්ෂි පවතී. ආරාම සංකීර්ණයක නටබුන් මෙම විහාරස්ථාන භූමියේ දැක ගැනීමට තිබේ. තිස්රියන් උස යෝජන ථූපයක්, පස්විසි පිරිවෙනක්, පධානඝර සඳකඩ පහන, ටැම්පිට විහාරය, පැරණි අවාස ගෙය, පැරණි ළිඳ ඇතුළු පුරාවිද්‍යාත්මක ස්මාරක ඒවාය. ඌව වෙල්ලස්සේ සංවර්ධන කටයුතු කළ සද්ධාතිස්ස රජුගේ දායකත්වය  මෙම විහාරස්ථානයට ලැබී ඇත. මහ රහතන්වහසේ ප්‍රමුඛ භික්ෂූන් 360 නමක් වැඩ වසන බව දැනගත් සද්ධාතිස්ස රජු දෙමහල් හා තුන් මහල් මන්දිර මෙම ස්ථානයේ ඉදිකර පූජාකළ බව ජනප්‍රවාදයේ දැක්වේ. අනුරාධපුර පොළොන්නරු යුගවලින් පසු කොටසර පියංගල රජ මහා විහාරස්ථානයට ස්වර්ණමය යුගය උදාවී ඇත්තේ මහනුවර යුගය තුළ බව විහාරාධිපති හිමියෝ පවසති. මහනුවර යුගයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු ලක්දිව පිරිහී පැවැති සඟ සසුන නැවැත නගා සිටුවීම අරමුණින් සියම් දේශයෙන් උපසම්පදා ශීලයෙහි පිහිටුවා ශ්‍රී ධර්ම කීර්ති යන ගෞරව නාමයද, ලෝහමය කරඬුවක්ද, පිරිවානා පොත්වහන්සේ නමක්, ඇත් දත්හි ඔතන ලද පිරිත් හුයක්ද ඇත්දළ මිට සහිත වටාපතක් ද කොටසර පියංගල විහාරස්ථානයට පූජා කොට ඇත.

දැනට සොයාගෙන ඇති නටබුන් අතරින් මේ පුද බිමේ ඇති සුවිශේෂ නටබුන් අතර පුරා විද්‍යාත්මක වටිනාකමක් හිමි වන්නේ පධානඝර නම් ගොඩනැගිල්ලටයි. දිගින් මීටර් 13 ක් ද පළලින් මීටර් 11 ද වන මෙය මනරම් ශිලා නිර්මාණයකි. මෙම පධානඝරය සද්ධාතිස්ස රජු (ක්‍රි.පූ 137-119) දවස තිස්ස නම් ඇමතියෙකු රජුගේ නියමය පරිදි මෙහි දෙමහල් පායක් හා තෙමහල් පායක් කළ බව විහාරස්ථ තුඩපතෙහි සඳහන් ය.

ජනප්‍රවාද අනුව බොහෝ දෙනා මෙය දළදා මාලිගාවක් ලෙස සලකනු ලබයි. පළමුවැනි විජයබාහු රජුගේ පාලන සමයෙන් අනතුරුව ලක්දිව රාජ්‍ය භාර ගනු ලැබුවේ පළමුවැනි වික්‍රමබාහු රජුය. (ක්‍රි.ව. 1111-1113) මොහුගේ පාලනයට එරෙහිවූ සුගලා බිසව දළදා වහන්සේ රැගෙන රුහුණු ප්‍රදේශයට පළා ගිය බව සඳහන් වේ. රුහුණේ දළදාව සඟවාගෙන සිටි කාලයේ මෙම දෙමහල්පායේ තැන්පත් කරන්නට ඇතැයි සැළකේ. මෙම පුදබිම ආසන්නයේ ඇති උඩ මල්ලැහැව සහ පල්ලේ මල්ලැහැව යන ග්‍රාම නාම අනුව දළදා මාළිගාවේ උඩු මහලට හා පහළ මහලට මල් ලබා දී ඇති නිසා එම ගම් වලට මෙම ග්‍රාම නාම ලැබුණු බව ගම්මු අදටත් විශ්වාස කරති.නුවර යුගයේ ඉදිකරණ ලද ටැම්පිට විහාරය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණය කර ඇත.

මෙම විහාරය නුවර යුගයේ ප්‍රතිමා කලාව හා චිත්‍ර කලාව පිළිබඳ අධ්‍යයනය කිරීමට අවැසි මහගු ස්ථානයක් ලෙස හඳුනාගෙන ඇත. ටැම්පිට විහාරයේ ප්‍රවේශ මණ්ඩපයේ ඇති මඩොල් කුරුපාව තවත් සුවිශේෂී නිර්මාණයකි.

මහනුවර යුගයේ ඉදිකරන ලද සංඝාවාසය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණය කර ඇත. නුවර යුගයේ ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රම උපයෝගී කොට නිර්මාණය කර ඇති මෙම සංඝාවාසය මැද මිදුල් දෙකකින් සමන්විතය. දොර ජනෙල් උළුවහු පැරණි වාස්තු විද්‍යානුකූලව නිර්මාණය වී ඇත. කීර්ති ශ්‍රී රාජසිංහ සමයේ කොටසර සඟ පරපුර යනුවෙන් සඟ පරපුරක් ඇරඹි අතර එහි මූලස්ථානය කොටසර විහාරස්ථානය විය. එහි භික්ෂූන් වහන්සේලාට විනය කර්ම කිරීම සඳහා ශ්‍රී වික්‍රම රාජසිංහ සමයේ මංගල සීමා කණු පිහිටුවා කළ පැරණි සීමා මාලකය මෙම විහාරස්ථානයේ දැනට ද දක්නට ඇත.

මහනුවර යුගයේ ගෘහ නිර්මාණ ශිල්පයට අනුව මැද මිදුල සහිතව කොටසර පියංගල රජ මහා විහාරයේ සංඝාවසය ඉදිකර ඇත. මැටි භාවිත කරමින් ගණකම සහිත බිත්ති බැඳ ඇත. වහලය මිටිය. අඩු ජනෙල් කවුළු ප්‍රමාණයකි. ඒවා කුඩාවට නිර්මාණය කර තිබේ. දොර උලුවහු වාස්තු ප්‍රධාන කරුණු 9ක් ඇතුළත්ව නිර්මාණය කර ඇත. මැද මිදුල් දෙකකි.

මෙම ආරාම භූමිය තුළ කළුගල් කුට්ටි යොදා නිර්මාණය කරන ලද ඉපැරණි ළිඳක් දක්නට ඇත. දැඩි නියඟ සමයක වුවද එහි ජලය සිඳී නොයයි. ඉපරණි ළිඳ කිර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේ මෙම ළිඳ ඉදිකර ඇත. ගැඹුරින් අඩි 60කි. පළල අඩි 2ක් පමණි. විහාරස්ථානයේ පෙරහරේ එන සැදැහැවතුන් මෙම ළිඳ ඉදිකිරීම සඳහා අවශ්‍ය ගල් ගෙනැවිත් ඇත. විහාරස්ථානයට අවශ්‍ය ජලය මෙන්ම අවට ගම්වලටද මෙම ළිඤෙන් ජලය සපයාගෙන ඇත. මේ වන විටත් ළිඳ ප්‍රයෝජනයට ගනු ලබයි.

මෙම පුදබිම තුළ පුරා විද්‍යාත්මක වටිනාකමින් අනූන කැඩී බිඳී ශේෂව ගිය නටබුන් අක්කර 12 ක පමණ භූමිභාගයක් පුරා විසිරී ඇත. කාලයේ වැලි තලාවෙන් වැසී ගිය අතීතයේ ශ්‍රී විභූතිය සඟවා සිටින තෝතැන්නක් ලෙස බිබිල කොටසර පියංගල පුද බිම හැඳීන්විය හැකි ය. අතීතයේ ශ්‍රී විභූතිය සඟවා සිටින බිබිල කොටසර පියංගල පුදබිම පුරා විද්‍යාත්මක සංරක්ෂිත ස්ථානයක් ලෙස නම් කර ඇත.

**ඌව පරණගම, කොටුවේ ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානය**

බදුල්ල දිස්ත්‍රික්කයේ ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උමාඇල ග්‍රාමයේ පිහිටි ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානය, ඌව පළාතේ විහාරස්ථාන අතර සුවිශේෂී ස්ථානයක් ගන්නා පැරණි විහාරස්ථානයකි. ඌවේ පිහිටි තනි කලු ගලෙන්ම ඉදිවූ එකම විහාර මන්දිරය, ඌවේ විශාලතම ධාතු කරඬුව, නිල්ගරුඬ පාෂාණයෙන් නිමවූ සිරිපතුල, සුමන සමන් දෙවියන් ඇතු පිට වැඩිවී

සිටින ඉරියව්ව සහිත අවුරුදු 120ක් පමණ පැරණි දේව ප්‍රතිමාව ආදිය එම විහාරස්ථානය සතු ඓතිහාසික වටිනාකම් අතර පවතී..

උමාඇල ගම්මානයේ වෙල්යායක් මධ්‍යයේ සුන්දර පරිසරයක පිහිටි ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානය වර්ෂ 1810 දී පමණ විහාරස්ථානයක් ලෙස ආරම්භ වී ඇති බවත් ඉන් පෙරද මෙහි පිහිටි බෝධීන් වහන්සේ හා නා ගසද කේන්ද්‍ර කොටගෙන මෙම ස්ථානය ජනතාවගේ වන්දනාමානයට පාත්‍රවූ ස්ථානයක් බවත් ජනප්‍රවාදයේ සඳහන්වේ.

ඌව පරණගම කියන්නේ අනූදහසක පමණ ජනගහනයක් සහිත එහෙත් ලංකා සිතියමේ නොමැති එකම නගරය. ඌව කැරල්ල හෙවත් නිදහස් සටන ආරම්භ වීමට ඌව පරණගම රේන්දපොල ග්‍රාමය ද  මූලික විය. මේජර් මැක්ඩොනල්ඩ් නම් ඉංග්‍රීසි හමුදා ප්‍රධානියාගේ උපදෙස් පරිදි සිංහල ගම්බිම් වනසා, ගේදොර- කෙත්වතු ගිණිතබා, පල දැරූ ගහකොල කපාදමා, ළමාවිය ඉක්මවූ සියලු පිරිමින් මරා දමා සිදුකළ ඒ විනාශය ආරම්භ වී ඇත්තේ මෙම  ප්‍රදේශයෙන් බව ඉතිහාසයේ දැක්වේ. එකළ අත්අඩංගුවට පත් ඇතැම් සටන් නායකයින් එල්ලා මරා දමන ලද සියඹලා ගස පිහිටා ඇත්තේ ද මෙම ග්‍රාමය සමීපයේය. එකල පැවති පුරාණ බලකොටුවක් පදනම් කරගත් ස්ථානයක මෙම විහාරස්ථානය ස්ථාපිත වීම හේතුවෙන් කොටුවේ ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානය යනුවෙන් ව්‍යවහාරවේ.

1810ට පෙරත් ජනතාව මෙම ස්ථානයේ වැඳුම් පිදුම් කළ බව පැවසෙනවා. එදා පැරන්නන් මහියංගනය විහාරස්ථානය වදින්න ගොස් ඇත්තේ මෙම විහාරස්ථානය අසලිනි. ඒ යන අතරතුර මෙහි නැවතී මේ ස්ථානයේ අදටත් දක්නට ඇති ගල් ඔරුවේ කිරි උණු කරගෙන පානය කළ බව ජනප්‍රවාදයේ සඳහන් වේ. එසේම විහාර භූමියේ තිබෙන වසර 800 ක් පමණ පැරණි බෝගසට හා නාගසට ප්‍රාර්ථනා බෝධීන් ලෙස පඬුරු බැඳ එම ජනතාව තම ගමන් ආරම්භ කළ බවද දැක්වේ.

මෙහි දක්නට ලැබෙන නිශ්චිතව පිළිගත් හැඩයක් නොමැති  දාගැබ ඉන්දියාවෙන් පැමිණි හැටක පමණ පිරිසක් විසින් ඉදිකළ බව පැවසේ. පුරාණයේ සිට පැවති  මෙහි තිබූ පුස්තකාලය වටිනා පුස්කොල පොත් 800 කින් සහ හම් පොත් දහසකින් පමණ සමන්විත ඌව පළාතේ තිබූ එකම පුස්තකාලය විය.

**ටැම්ගොඩ රජ මහා විහාරය**

ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් යල්කුඹුර ග්‍රාමයේ ටැම්ගොඩ රජමහා විහාරය පිහිටා ඇත. බිබිල නගරයේ සිට බදුල්ල දෙසට ගමන් කිරීමේ දී කිලෝමීටර් 07ක් පමණ ඉක්ම ගිය විට මෙම විහාරස්ථානයට පිවිසිය හැකි ය. 1818 නිදහස් සටනේ දී ස්වදේශික සටන්කරුවන්ට රැකවරණය දුන් ස්ථානයක් ලෙසින් ජනප්‍රවාදයේ සඳහන්වේ

මෙම විහාරස්ථානයේ ඉතිහාසය විමසීමේ දී දුටුගැමුණු මහරජුගේ පියාණන්  වන කාවන්තිස්ස රාජ සමය තෙක් ඈතට දිව යයි. එකල රජරට එළාර රජුගේ අණසකට නතුව තිබූ අතර රුහුණු ප්‍රදේශයේ පාලනය කාවන්තිස්ස රජු සතු විය. නමුදු ඔහුට ලංකාව එක්සේසත් කිරීමට එළාර රජු හා සටන් කිරීම දුෂ්කර වූවක් විය. ඒ සඳහා ඔහු අනුගමනය කළ ක්‍රියා පිළිවෙත වූයේ තම පුත් ගැමුණු කුමරුට ඒ සඳහා සුදුසු පරිසරය සකස් කර දීමය. මෙහි දී රජු කළේ රුහුණු දේශයේ සිට සේරුනුවර දක්වා ප්‍රදේශයේ ජනතාව එක්සත් කරලීම ය. එම කාර්යය සාදනය සඳහා බෞද්ධ ජනතාව ඒකරාශි කරනු වස් යොදුනෙන් යොදුනට විහාරස්ථාන කළ බව සඳහන් වේ. මේ අනුව ඉදිකළ එක් විහාරස්ථානයක් ලෙස ටැම්ගොඩ රජමහා විහාරය හැඳින්විය හැකි ය. මෙහි දක්නට ඇති ස්තූපය කාවන්තිස්ස රජතුමා කළ ස්තූපවලින් එකක් ලෙස සැළකේ. චෛත්‍ය

ප්‍රතිසංස්කරණයේ දී කළ කැණීම්වලින් දේවානම්පියතිස්ස රජුන්ගේ පිළිරුවක් ද තිබී හමුවූ බව ජනප්‍රවාදයේ සඳහන් වේ.

ජනප්‍රවාදයේ තවත් තැනෙක සඳහන් වන්නේ මේ විහාරස්ථානය දේවානම්පියතිස්ස රාජ සමයට අයත් බවකි. මීට අමතරව විහාරස්ථානය පිළිබඳව තොරතුරු සඳහන් වන්නේ බුද්ධදාස රජතුමාගේ කාලයේ දී ය. මෙම විහාරස්ථානය ඔහු විසින් ප්‍රතිසංස්කරණය කරන ලද බව සඳහන් වේ. රජ සමයේ සිටුවනු ලැබූ ටැම් ලිපියක් මෙහි ඉතිහාසය විචාරීම සඳහා ද උපකාරී වේ.

***"මපුරම බුදහ සිරිමේඝ සිරිසඟබෝයි ස්වේතඡත්‍රව නංවා රජ වී හතර වන රාජ්‍ය ඇවෑමෙන් බෙජල ග්‍රාමයේ විසූ සිරිනාග විසින් ලටියබදරි හා මහදරි යන කුඹුරු යායවල් පූජා කරන ලදී"*** යන්න මෙහි අරුතවේ. මෙහි දැක්වෙන **මපුරම බදහ** යනු බුද්ධදාස රජු ලෙස සැළකේ.

දීර්ඝ කාලයක් පුරා විනාශයට පත්ව තිබූ මේ විහාරස්ථානය නැවත ප්‍රතිසංස්කරණය කරන ලද්දේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ සමයේදී ය. එකල කොකුන්නෑවේ සිල්වත් තැන සංඝකීර්ති නමින් උපසම්පදාව ලබා ඌව වෙල්ලස්සේ විහාරස්ථාන නඟා සිටුවමින් බුදුසසුන නංවාලීමට මහත් වෙහෙසක් දරා ඇත. උන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යයෙකු වූ බණ්ඩිගොඩේ නිග්‍රෝසධ හිමියන් ටැම්ගොඩ රාජ මහා විහාරය ඇතුළු වෙල්ලස්සේ විහාරස්ථාන රාශියක් ප්‍රතිසංස්කරණය කර ඇත.

**බෝගොඩ පෞරාණික රජමහා විහාරය**

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බෝගොඩ ග්‍රාම නිළධාරි වසමේ පිහිටි ඉපැරණි පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථානයක් ලෙසට බෝගොඩ පෞරාණික රජමහා විහාරය හා ඉපැරණි ලී පාලම හැඳින්විය හැකි ය. හාලිඇල - වැලිමඩ මාර්ගයේ කිලෝමීටර 11ක් පමණ ගමන් කිරීමෙන් අනතුරුව ජගුල්ල හන්දියෙන් වම් දෙසට ඇති මාර්ගයේ කිලෝමීටර 2.5 ක් පමණ ගමන් කිරීමෙන් අනතුරුව මෙම පෞරාණික ස්ථානයට ළඟාවිය හැකිවේ.

1818 නිදහස් සටනේ දී සිංහල නායකයින්ට මෙන්ම සටන්කරුවන්ට ද ආරක්ෂාව ලබාදුන් විහාරස්ථානයක් ලෙස ජනප්‍රවාදයේ සඳහන් වී ඇත.

මෙහි ඉපැරණි දැව පාලම හා කටාරය සහිත ලෙන් විහාරය ඉපැරණි පුරාවිද්‍යාත්මක ස්මාරක වේ. එහි ඇති දුර්ලභ වූ ලී පාලම හේතුවෙන් මෙය ප්‍රසිද්ධත්වයට පත්ව ඇත. මෙහි පුරාණත්වය එහි ලෙන් පියස්සේ කොටා ඇති පූර්ව බ්‍රහ්මී ලෙන් ලිපි වලින් සනාථ වේ.

***"පරුමත තිග පුත බමකදශ ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ පඩිට්තෙ"***

එනම් ප්‍රධාන වූ තිස්සගේ පුත්‍ර බ්‍රහ්මදත්තගේ ලෙන, පැමිණි නොපැමිණි සිව්දිග සංඝයා වෙත පිහිටුවන ලද්දේය යනුවෙනි. එහි අනෙක් ලිපියේ ***"උපශිකෙ"*** යනුවෙන් සඳහන් වන අතර උපාසිකාවන් වෙනුවෙන් පූජාකල පූජාවන් පුජාකල ස්ථානය බවට දැක්වේ.

මෙම ලෙන් විහාරයේ වන අනෙකුත් ඉදිකිරීම් නුවර යුගයේ හා ඉන් පසු කාලීනව සිදුකරනු ලබන ඒවා බව සඳහන් ය. ලෙන් විහාරයේ ඇතුළු ගෘහය තුළ ප්‍රධාන සැතපෙන බුද්ධ ප්‍රතිමාව ද, හිටි බුද්ධ ප්‍රතිමාව ද, සමාධි බුද්ධ ප්‍රතිමාව ද දක්නට ලැබේ. එය අලංකාරවත් මකර තොරණකින් යුක්ත වේ. සැතපෙන බුද්ධ ප්‍රතිමාවේ පාද පසින් බිත්තියේ කෙවණියක් කපා එහි තුළ විෂ්ණු දේව ප්‍රතිමාවක් නිර්මාණය කර ඇත. මෙම ලෙන් විහාරයේ වම් පස කොටස දේවාලයක් ලෙසට භාවිතයට ගන්නා අතර ප්‍රධාන දෙවියන් ලෙස විෂ්ණු දෙවියන් මධ්‍යයේ දෙපස වැඩ සිටින

කතරගම හා සමන් දේව ප්‍රතිමා දක්නට ලැබේ. විහාරස්ථානයේ පැරණි සංඝාවාසය මැද මිදුලක් සහිත වන අතර මැද මිදුල වටා භික්ෂූන් වහන්සේලාගේ කුටි, මුළුතැන්ගෙය හා ගබඩා කාමර පිහිටා ඇත. විවෘත ආලින්දයෙහි සංඝාවාසයට ඇතුළු වන දොරෙහි උළුවස්ස අලංකාර කැටයමින් යුක්ත වේ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් පස්සර විහාරයට හා බෝගොඩ විහාරයට පොදුවේ ප්‍රධානය කරන ලද සන්නසක් විහාරය සතුව පවති.

මෙම විහාරස්ථානය සමග සම්බන්ධ අනෙක් සුවිශේෂී පුරාවිද්‍යාත්මක ස්මාරකය වනුයේ බෝගොඩ ඉපැරණි ලී පාලමයි. මෙය 16 වන සියවස දඹදෙණි රාජධානි යුගයේ ඉදිකරන ලද්දකි. ගල්ලන්දා ඔය හරහා යෙදූ මෙම ලී පාලම ලෙන් විහාරය හා බැඳි සුවිශේෂිම වටිනාකමකින් යුත් අංගය වේ. කඳු මුදුනේ ඇති ගම්මානයේ සිට ජනතාවට විහාරස්ථානයට පැමිණීමට ගල්ලන්දා ඔයෙන් එගොඩ වීමට ඇති දුෂ්කරතා මඟ හරවා ගැනීමට මෙම පාලම තනා තිබේ. පාලම දෙපස බීරළු සහිත අත්වැල් දෙකකි. එක් පසෙක කණු 10 බැගින් දෙපස කණු 20 කින් සමන්විත වන අතර එම කණු මත වහලය ගොඩනංවා ඇත. වහලයට පෙති උළු සෙවිලි කර තිබේ. මෙම ලී පාලම දිග අඩි 50ක් ද , පළල අඩි 6 ක් ද වන අතර උස අඩි 8 කි. වහළයට යොදා ඇති උළු මහනුවර යුගයේ බලපෑම ඉස්මතු කරයි. තව ද මහනුවර යුගයේ ගොඩනැගිලි වල ලක්ෂණද මෙම පෞරාණික ලී පාලමේ දක්නට ලැබේ. ගල්ලන්දා ඔය හරහා දමන ලද විශාල ලී කඳන් තුනක් භාවිතා කර සියලුම කොටස් දැවයෙන් ම පමණක් නිර්මාණය කර ඇත. කොස්, කුඹුක්, කළුවර, මිල්ල වැනි දැවයන් යොදාගෙන අඩි 30 ක් පමණ උස කුඹුක් කඳන් මත මෙම පාලම නිර්මාණය කර ඇත.

**කොටබෝව කුඩා කතරගම දේවාලය**

මොණරාගල දිස්ත්‍රික්කයේ, මැදගම ප්‍රාදේශීය මහලේකම් කොට්ඨාශයේ කොටබෝව කුඩා කතරගම දේවාලය පිහිටා ඇත. ඌව වෙල්ලස්ස නිදහස් සටනේ ආරම්භක අවස්ථාව සනිටුහන් කරන ස්ථානයක් වශයෙන් කොටබෝව කුඩා කතරගම දේවාල පරිශ්‍රය පිළිගැනේ. මෙහි ආරම්භය ශ්‍රී වික්‍රම රාජසිංහ රාජ්‍ය කාලය දක්වා ගමන් කරනු ලැබේ. කොටබෝව දේවාලයේ පුරාවෘත්තය සිත් ගන්නා අපූර්ව සිද්ධියක් වශයෙන් බොහෝ දෙනාගේ පිළිගැනීමට ලක්වී තිබේ. මෙම දේවාලයේ ආරම්භය *ඔත්තඹදෙන* නමින් යුත් උඩරට වලව්වක් වටා සකස්වී ඇත. මෙම ඔත්තඹදෙන වලව්වට අක්කර 423 විශාල ඉඩම් ප්‍රමාණයක් හිමිවී තිබුණු අතර පසුකාලයක කොටබෝව දේවාලයට ඒ සියල්ලම අයත් විය. මෙම වලව්වේ සිටි ලොකු බණ්ඩාර රන්බණ්ඩා සහ කිරිබණ්ඩා යන තුන් සොහොයුරන්ගේ රූමත් නැගෙණිය, වෙළෙඳාමේ පැමිණි හෙට්ටි වෙළෙඳුන් දෙදෙනෙකු මාර්ගයෙන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ ග්‍රහණයට ගැනීමට යෙදූ උපායශීලී කාර්යය අසාර්ථකවීමෙන් අවසානයේ මියගිය වැඩිමහල් සහෝදරයා වූ ලොකු බණ්ඩාර දේවත්වයට පත්වූ මෙම කථා පුරාවෘත්තය අතිශයින් ම චමත්කාරජනක සිදුවීම් ගණනාවකින් සමන්විතය. මෙලෙස කොටබෝවේ ලොකු බණ්ඩාර ආදාහනය කළ ස්ථානය කොටබෝවේ කුඩා කතරගම දේවාලය යන නමින් ක්‍රමානුකූලව හැඩගැසුණි. එතැන් සිට ම බැතිමතුන් පුද පූජා දක්වමින් මෙම දේවාලයේ ආශිර්වාදයත් අපේක්ෂිතව වන්දනාමාන කළ බැව් කියති.

බදුල්ල උප ඒජන්ත වූ විල්සන් මරාදැමූ මීගහපිටියේ රටේ රාළ ද දේවත්වයක් ලබා ඇතැයි ජනප්‍රවාදයේ පවතී. බිබිල කොටබෝව ඓතිහාසික කුඩා කතරගම දේවාල බිමේ දැකි ය හැකි පැරණිම දේවාලය වන බණ්ඩාර දේවාලයේ මෙම දෙවියන් වැඩ සිටින බවත් එනිසා එම දේවාලයේ යාදිනි වලදී මුලින්ම මිග හපිටිය වලව්වේ කුනම් බැඳි අලුත් බණ්ඩාර දෙවියෝ යනුවෙන් ද කියැවෙන බව දැනගන්නට ලැබුණි